# WEB DESIGNING USING MULTIMEDIA

# (Part-I)

# වෙබ් අඩවි නිර්මාණය සඳහා තොරතුරු ව්‍යුහගත කිරීම

## වෙබ් අඩවියක භාවිතය (Application of web site)

- තොරතුරු සන්නිවේදනය (Information Communication)

  උදා: www.nie.lk , www.webopedia.org

- වෙළඳාම (e commerce)

  උදා: www.ebay.com, www.amazon.com

- විනෝදාස්වාදය (Entertainment)

  උදා: www.netflix.com, www.youtube.com

- ප්‍රචාරණය (Advertising)

  උදා: www.onclickads.net , www.adcash.com

- ප්‍රවෘත්ති බෙදාහැරීම (News)

  උදා: www.rupavahini.lk , www.bbc.co.uk

ClassWork.LK

- සමාජ සම්බන්ධතා ගොඩනැගීම (Building up social media)

  උදා: www.facebook.com , www.linkedin.com

- සෙවුම් අවශ්‍යතා (Search engine)

  උදා: www.google.com , www.msn.com

- පෞද්ගලික අවශ්‍යතා (Personal)

  උදා: www.president.gov.lk ,

  www.arthurcclarke.net

## ග්‍රාහක කණ්ඩායම් විශ්ලේෂණය

- භාෂාව හා සංස්කෘතිය
- වයස් මට්ටම
- අධ්‍යාපනික මට්ටම
- ස්ත්‍රී පුරුෂ බව
- රුචිකත්වය

ClassWork.LK

# වෙබ් අඩවියක අන්තර්ගතය (Web content)

- විවිධ පාඨ (text)
- රූප
- ශබ්ද
- වීඩියෝ
- සජීවීකරණ (Animations)
- ප්‍රකාශන හිමිකම (Copyright) හා යාවත්කාලීන බව පිළිබඳ තොරතුරු
- වෙනත් ලේඛන, රූප, ශ්‍රව්‍ය දෘශ්‍ය ගොනු, සමාජ වෙබ් අඩවි ආදිය සඳහා වූ අධිසන්ධාන
- දැන්වීම්
- සෙවුම් පහසුකම්
- වෙබ් අඩවිය පරිශීලනයට අදාළ ඇතැම් මෘදුකාංග, අකුරු වර්ග බාගත කර ගැනීමේ පහසුකම්

ClassWork.LK

# සන්ධාරය සංවිධානය (Content Management)

වෙබ් අඩවියක් සඳහා තෝරාගත් අන්තර්ගතය, ක්‍රමවත් පිළිවෙලකට පෙළගැස්වීම සන්ධාරය සංවිධානය යන්නෙන් අදහස් වේ.

- රූපමය සැකසුමකට අනුව වර්ගීකරණය.
- මුල් පිටුවෙන් (Home Page) වෙබ් අඩවියේ සමස්ත අන්තර්ගතය කෙටියෙන් නිරූපණය කිරීම.
- තොරතුරු කෙටියෙන් ඉදිරිපත් කිරීම.
- අංකිත ලැයිස්තු (Numbered List), අංකිත නොවන ලැයිස්තු (Bulleted List) හෝ අනුජේදන (Indentation) භාවිතය.
- පහසුවෙන් වෙබ් අඩවියේ සැරිසැරීමේ හෙවත් සංචලනය (Navigate) වීමේ පහසුකම ලැබේ.
- යාවත්කාලීන බව

ClassWork LK

# <u>වෙබ් පිටුවල ව්‍යුහය හා පිරිසැලසුම (Structure and layout)</u>

- සෑම පිටුවක ම වෙබ් අඩවියේ අනන්‍යතාව පවත්වා ගැනීම.
- වැදගත් කරුණු උද්දීපනය
- ඕනෑ ම / විවිධ වර්ගයේ පරිගණකවලින් වෙබ් අඩවිය පරිශීලනය කළ හැකි වීම.

## <u>මාධ්‍ය සම්පත් තෝරා ගැනීම</u>

**ධාරිතාව**

වෙබ් පිටුවකට ඇතුළත් කරන මාධ්‍ය සම්පත්වල ධාරිතාව සහ එම වෙබ් පිටුව විවෘත වීමට ගතවන කාලය අතර දැඩි සම්බන්ධයක් ඇත.

එබැවින් විවිධ ක්‍රම මඟින් ඒවායෙහි ධාරිතාවය අඩු කළ යුතුය.

Class Work.LK

**හිමිකම් නීතියට අනුකූල ව මාධ්‍ය සම්පත් ඇතුළත් කිරීම.**

වෙනත් අයකු විසින් නිර්මාණය කරන ලද මාධ්‍ය සම්පත් යොදා ගන්නේ නම් නිසි අවසර ලබා ගත යුතු ය.

ClassWork.LK

ClassWork.LK